# සාමාන්‍ය සමයේ විසිඑක්වන සතිය
# සෙනසුරාදා

## පළමුවන කියැවීම

ශුද්ධවූ පාවුළු තුමන් විසින් තෙසලෝනිකවරුන්ට ලියන ලද පළමු හසුනෙන් කොටසකි.

1 තෙසලෝනික 4: 9-12

"එකිනෙකාට ප්‍රේම කිරීමට ඔබ දෙවියන් වහන්සේගෙන් ඉගෙන ගෙන සිටින්නහු ය."

සහෝදරයෙනි, සහෝදර ප්‍රේමය ගැන ඔබට ලියා එවීම වුවමනා නැත. කුමක් හෙයින් ද, එකිනෙකාට ප්‍රේම කිරීමට ඔබ දෙවියන් වහන්සේගෙන් ඉගෙන ගෙන සිටින්නහු ය. සැබැවින් ම ඔබ මසිදෝනිය මුළුල්ලෙහි සිටින සියලු සහෝදරයන්ට එසේ කරන්නහු ය. එහෙත්, සහෝදරවරුනි, තව වඩ වඩා ඉදිරියට යන මෙන් අපි ඔබෙන් ඉල්ලා සිටිමු. ඔබට අප කලින් අවවාද කළ පරිදි, උපශාන්ත ජීවිතයක් ගත කිරීමටත්, තම තමාගේ කාරණා බලා ගැනීමටත්, දහඩිය මහන්සියෙන් ජීවිකාව කර ගැනීමටත්, අරමුණු කරගන්න. මෙසේ කිරීමෙන් ඔබට සභාවෙන් පිටත සිටින්නන්ගේ ගෞරවය දිනා ගෙන, අන්‍යයන්ගේ පිහිටාධාර පිට නොරැඳී සිටීමට හැකි වේ.

දේව වාක්‍යය එසේය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 98 : 1, 7-9

පිළිතුර: සමිඳාණෝ ලෝ වැසියන් සාධාරණකමින් පාලනය කරන සේක.

ගීය:

සමිඳුන්ට නව ගීයක් ගයන්න. මන්ද, එතුමාණෝ අසිරිමත් ක්‍රියා කළ සේක. සිය බලයෙන් හා ශුද්ධ ශක්තියෙන් ජයග්‍රහණය ලත් සේක.

මුහුද ද එහි ඇති සියල්ල ද ගර්ජනා කෙරේවා! ලෝකය ද එහි වැසියෝ ද ගී ගයත්වා! ගංගා අත් පොළොසන් දේවා! කඳු හෙල් එක්ව සමිඳුන් හට ප්‍රීති නාද දේවා!

මන්ද, සමිඳාණෝ මිහිතලය පාලනය කරන පිණිස වඩින සේක.
එතුමාණෝ ලෝ වැසියන් ධර්මිෂ්ඨකමින් ද සාධාරණකමින් ද පාලනය කරන සේක.

## සාධුකාරය (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!
ඔබ ජීවන පණිවුඩය ප්‍රදානය කරමින්
අඳුරු ලෝකයක දීප්තිමත් තාරකා මෙන් බබලන්නහු ය.
ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!

එකිනෙකාට ප්‍රේම කරන්න. මා ඔබට ප්‍රේම කළාක් මෙන් ඔබටත් එකිනෙකාට ප්‍රේම කරන්න.

ආලේලූයා!

## සුවිශේෂය

සුවිශේෂක මතෙව් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

මතෙව් 25: 14-30

"ඔබ ස්වාමියාගේ ප්‍රීතියට සහභාගී වන්න."

"ස්වර්ග රාජ්‍යය මෙසේ උපමා කළ හැකිය. එක් මිනිසෙක් සිය දාසයන් කැඳවා තමා සතු දේ ඔවුනට භාර දී පිටරට බලා ගියේය. ඔහු එකිනෙකාගේ හැකියාව අනුව, එක් කෙනෙකුට රිදී කාසි පන්දාහක් ද තව කෙනෙකුට දෙදාහක් ද, තවත් කෙනෙකුට එක්දාහක් ද බැගින් දී තමා යන ගමන ගියේය. රිදී කාසි පන්දාහ ලැබූ තැනැත්තේ වහාම ගොස් එයින් වෙළඳාම් කොට තවත් රිදී කාසි පන්දාහක් උපදවා ගත්තේය. එලෙසම රිදී දෙදාහ ලැබූ තැනැත්තේ ද තවත් දෙදාහක් උපදවා ගත්තේය. එහෙත් දාහක් ලැබූ තැනැත්තේ ගොස් පොළොවේ වළක් හාරා ස්වාමියාගේ මුදල සඟවා තැබීය.

බොහෝ කලකට පසු ඒ දාසයන්ගේ ස්වාමියා අවුත් ඔවුන් සමග ගණන් හිලව් බැලීය. රිදී කාසි පන්දාහ ලැබූ තැනැත්තේ තවත් රිදී කාසි පන්දාහක් ගෙනවුත්, 'ස්වාමිනි, ඔබ මට රිදී කාසි පන්දාහක් භාර දුන්නෙහි ය. මෙන්න තවත් රිදී කාසි පන්දාහක් උපදවා ගතිමි.' යි කීය. ඔහුගේ ස්වාමියා ඔහුට කතා කොට, 'යහපත් විශ්වාසී දාසය, ඉතා

අගෙයි ඔබ ස්වල්පයක් ගැන විශ්වාසී වූ බැවින් බොහෝ දේ කෙරෙහි අධිපති කරමි. ඔබ දැන් අවුත් ඔබේ ස්වාමියාගේ ප්‍රීතියට සහභාගී වන්නැ'යි කීය. රිදී කාසි දෙදාහක් ලැබූ තැනැත්තේ ද අවුත්, 'ස්වාමිනි, ඔබ රිදී කාසි දෙදාහක් මට භාර දුන්නෙහි ය, මෙන්න, තවත් රිදී කාසි දෙදාහක් උපදවා ගතිමි'යි කීය. ඔහුගේ ස්වාමියා ඔහුට කතා කොට, 'යහපත් විශ්වාසී දාසය, ඉතා අගෙයි. ස්වල්පයක් ගැන ඔබ විශ්වාසී වූ බැවින් බොහෝ දේ කෙරෙහි ඔබ අධිපති කරමි. ඔබ දැන් අවුත් ඔබේ ස්වාමියාගේ ප්‍රීතියට සහභාගී වන්නැ'යි කීය. ඉන්පසු රිදී කාසි එක් දහක් ලැබූ තැනැත්තේ ද අවුත්, 'ස්වාමිනි, ඔබ නොවපුළ තැනින් කපන, වගා නොකළ තැනින් පල රැස් කරන, තද හිතක් ඇති මනුෂ්‍යයෙකු බව දැන ගතිමි. එබැවින් මම බියෙන් ගොස් ඔබේ රිදී කාසි පොළොවේ වළක සඟවා තැබීමි. මෙන්න ඔබ සතු දේ' යි කීය. ඔහුගේ ස්වාමියා ඔහුට උත්තර දෙමින්, 'කම්මැලි කපටි දාසය, මා නොවපුළ තැනින් කපා ගන්නා බවත්, වගා නොකළ තැනින් පල රැස් කර ගන්න බවත් ඔබ දැන සිටියෙහි ද? එසේ නම්, මාගේ මුදල බැංකුවේ තැන්පත් කළ යුතුව තිබුණේය. එසේ කළේ නම් මා ආ විට මගේ මුදල පොලියක් සමඟ ලබා ගන්නට පුළුවන්කම තිබිණි. එබැවින් ඒ රිදී කාසි ඔහුගෙන් ගෙන රිදී කාසි පන්දාහ ඇති තැනැත්තාට දෙන්න. යමක් ඇති තැනැත්තාට දෙනු ලැබේ. ඔහුට පමණටත් වඩා ලැබේ. යමක් නැති තැනැත්තාගෙන් ඔහුට ඇති ටිකත් ගනු ලැබේ. මේ පලක් නැති දාසයා පිටත අන්ධකාරයට නෙරපා දමන්න. එහිදී වැලපීමත් දත්මිටි කෑමත් වන්නේය'යි කියනු ඇත."

සුවිශේෂ වාක්‍යය එසේය.